ආයතනයේ නම : විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர்: மின்சாரம் மற்றும் எரிசக்தி அமைச்சு பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பா எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution: **Ministry of Power & Energy**
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

විදුලිබල අංශය

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලන සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

ආයතනයේ නම - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ අඩුපාඩු	එම කරුණු සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම
1. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබීම	අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2022 හා 2023 වර්ෂ සඳහා සකස් කර ඇත.
2. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදරිපත් කර නොතිබීම.	2020 කාර්ය සාධන වාර්තාව 2021.07.05 දින පාර්ලිමේන්තුවට භාර දී ඇති අතර 2021 වාර්තාව සඳහා අවසන් විගණකාධිපති වාර්තාව මෙම අමාත්‍යාංශයට ලැබී ඇත්තේ 2022.06.15 දින වන අතර එම තොරතුරු ඇතුලත් කරමින් කාර්ය සාධන වාර්තාව මුද්‍රණය කර 2022.08.02 දින භාර දී ඇත. තවද, අදාළ වාර්තා භාර දීමට පාර්ලිමේන්තුවට පිවිසීමට අවසර ලබා ගැනීමට ඇති වූ ප්‍රමාදය හේතුවෙන් 2021 කාර්ය සාධන වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.
3. ආයතන පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබීම.	2020 වන විටත් වෙබ් අඩවිය නිර්මාණය කර තිබූ අතර මේ දක්වාම නව තොරතුරු යාවත්කාලීන කරමින් අමාත්‍යාංශය විසින් වෙබ් අඩවිය පවත්වා ගෙන යනු ලබයි.
4. පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම.	2020 වර්ෂයේ අමාත්‍යාංශයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා පත්කර ඇති කම්ටුව සකස් කරන ලද පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සඳහා 2022 වර්ෂයේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඒ සම්බන්ධයෙන් සියලු නිලධාරීන් දැනුවත් කර අමාත්‍යාංශ වෙබ් අඩවියේද පළකර ඇත.

01/25

5. ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	2022 වර්ෂය වන විට අමාත්‍යාංශයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය සඳහා අංශ භාර මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කර ඇත.
6. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබීම.	2023 වර්ෂය සඳහා පුහුණු අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති වුවද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත. අදාල ප්‍රතිපාදන ලබා දෙනු ඇතැයි අපේක්ෂාවෙන් 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන් වෙතින් අවශ්‍ය පුහුණු අවශ්‍යතා පිළිබඳව විමසීම් කර පැය 12ක අවම පුහුණුවක්වත් ලබා දීමට සැලසුම්ගතව ඇත
7. සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම.	2023 වර්ෂයේ සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කොට ඇත.
8. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම.	2020 වර්ෂයේදී කොවිඩ් වසංගතය තත්ත්වය හේතුවෙන් සහ පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් ලෙස නොපැවැත්වීම මත අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන්ට සැලසුම්ගත පුහුණු අවස්ථා ලබාදීමට නොහැකි වී ඇත. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමේ අපේක්ෂාවෙන් 2023 වර්ෂයේ ප්‍රමාණවත් පුහුණු අවස්ථා ලබාදීමට සැලසුම් කර ඇත.

එම් පී ඩී යූ කේ මාපා පතිරණ
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
25/01/2023

එම් පී ඩී යූ කේ මාපා පතිරණ
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
අංක **80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා**
කොළඹ 07.

බලශක්ති අංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 183 - රාජ්‍ය ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත කොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය

පළමු කොටස

අනු අංකය	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කම්ටුව විසින් ලබා දුන් නියෝගයන්	අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශය ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය කම්ටුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම	2020 අගෝස්තු මස 30 වන දින සිට බලශක්ති අමාත්‍යාංශය නමින් නව අමාත්‍යාංශයක් පිහිටවූ අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ එතැන් පටන් මේ දක්වා නිසි පරිදි විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. යම් විගණන විමසුමක් සඳහා පිළිතුරු ලබා දීමට අතිරේක කාලයක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විගණකාධිපතිවරයා ඇමතීමෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන ඇත.
02	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම	2020 අගෝස්තු මස 30 වන දින සිට බලශක්ති අමාත්‍යාංශය නමින් නව අමාත්‍යාංශයක් පිහිටවූ අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ එතැන් පටන් මේ දක්වා නිසි පරිදි අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නිසි කාලසීමාව ඇතුලත පිළිතුරු ලබා දී අති බව දන්වා සිටිමි.
03	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම.	මේ වන විට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත පරිදි ක්‍රියාත්මක කර ඇත. භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි අයුරින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
04	වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	එවැනි ගර්හිත වාහන මේ වන විට අමාත්‍යාංශය තුළ නොමැත. පාවිච්චියට ගත නොහැකි රථ වාහන විධිමත් පරිදි අපහරණය කිරීමට පියවර ගෙන ඇත.
05	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම.	මේ වන විට බැංකු සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් වූ ගැලපුම් නිසි පරිදි නිරවුල් කර අදාල අංශ වෙත ඉදිරිපත් කර ඇත.

01/10

06	වර්ෂ එකකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ පැවතීම.	මෙම ණය මුදලට අදාල ණය කරු සදාකල් ඔත්පල තත්ත්වයට පත්වීම හේතුවෙන් ඔහු බාර ගැනීමට ද කිසිදු ඥාතියෙකු ඉදිරිපත්ව නැති බවට නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, මෙම නඩුව ඉදිරියට පවත්වා ගෙන යාම අපහසු බවද ඒ සම්බන්ධයෙන් 2021.03.01 දිනැතිව නීතිපති වෙත දන්වා යවා ඇත. ඒ අනුව, මෙම නඩුකරය නිශ්ප්‍රභ කර ඇති බව ගරු අධිකරණය විසින් දැනුම් දී ඇත. එබැවින්, මෙම ණය මුදල පොත් වලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීම සඳහා අනුමැතිය ලද විගස මෙම හිඟහිටි ණය ශේෂය පොත්වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත.
07	මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	2020 වර්ෂයේ එසේ සිදුවුවද මේ වන විට එම තත්ත්වය වළක්වා ඇති අතර නියමිත සීමාවට පමණක් අතුරු අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කර ඇත.
08	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ ගලපා වෙනස්කම් මාසිකව සසඳා නොතිබීම.	මේ වන විට මාසිකව අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ ගලපා වෙනස්කම් මාසිකව සැසඳීම සිදුකරනු ලබයි.
09	රැස්කර තිබූ ආදායම් නියමිත කාලය තුළ නියමානුකූල ලෙස බැහැර කර නොතිබීම.	රැස්කර තිබූ ආදායම් නියමිත කාලය තුළ නියමානුකූල ලෙස බැහැර කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
10	සමාලෝචන වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම	2020 වර්ෂයේ ආරම්භයේ සිට පැවති කොවිඩ් වසංගතය තත්ත්වය හා සේවා ස්ථාන වෙත නිලධාරීන් කැඳවීම සීමාවීම හේතුවෙන් තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයක් මත මුද්‍රණ කටයුතු ප්‍රමාද විය. විගණන වාර්තාවන්ද නිසි දිනට පෙර නොලැබීම යනාදී කරුණු හේතුවෙන් නියමිත දිනට කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. එසේ වුවද, මේ වන විට 2021 වර්ෂයට අදාළ වාර්තාව ද ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි.

01/10

දෙවන කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබා දුන් නියෝගයන්	අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශය ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය කමිටුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් මේ වන විට සකස් කර ඇත. එහි තවදුරටත් කළයුතු සංශෝධනයන් සිදු කරමින් පවතී.
02	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතීම.	2020 වර්ෂයේ පැවති කොවිඩ් රෝගී තත්ත්වය හේතුවෙන් නිසි පරිදි කාර්යාල පවත්වාගෙන යාම සීමා වූ බැවින් සැලසුම් කළ පරිදි කාර්ය මණ්ඩල පුහුණු පැවැත්වීමට නොහැකි වූ බව දන්වා සිටිමි. එසේ වුවද, හැකි හැම විටම අදාළ පුහුණු වැඩසටහන් උපරිම අයුරින් පැවැත්වීමට කටයුතු කර ඇත.
03	විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබීම.	විගණකාධිපතිවරයා විසින් විගණන ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ මේ වන විට නිවැරදි කර ඇති අතර ඉදිරියේ දී වෙවැනි දෝෂ ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. තවද, ඒ පිළිබඳ නිරන්තර පසු විපරම් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

එම් පී ඩී යූ කේ මාපා පතිරණ
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
10/01/2023